

## ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

දිවයින පුරා ශාඛා 272 කින් යුත් ජාලයකින් සහ 3000 කට වැඩි ශ්‍රම බලකායකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පුරප්පාඩුව ඇති පහත තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත විශිෂ්ඨ නායකත්ව හැකියාවකින් යුත් පළපුරුදු වෘත්තිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# ප්‍රධාන තොරතුරු නිලධාරී

**ප්‍රධාන අවශ්‍යතා**

පහත සඳහන් සුදුසුකම් ලබා තිබිය යුතුය.

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ ඉංජිනේරු හෝ තොරතුරු සන්නිවේදන තාක්ෂණ උපාධියක් සමග විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබීම.

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණ මෙහෙයුම් කටයුතු පිළිබඳ වසර 12 ක සමස්ත පළපුරුද්දක් සමග ඉන් අවම වශයෙන් වසර 08 ක ජ්‍යෙෂ්ඨ කළමනාකාර (ප්‍රධාන කළමනාකරණ සහ ඉන් ඉහළ, එයින් වසර 05ක් සහකාර සාමාන්‍යාධිකාරී හෝ ඉන් ඉහළ) මට්ටමේ පළපුරුද්දක් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ලබා තිබීම.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු පිළිබඳ ප්‍රවීනත්වය සහ නවීන බැංකුකරණ තාක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ අවබෝධය
- බැංකු ව්‍යාපාර කටයුතු ස්වයංක්‍රියකරණය කිරීම පිළිබඳ සංකල්පනාත්මක හැකියාවන් සහ ඒවා සංවර්ධනය කිරීමේ හැකියාවන් තිබිය යුතුය.
- වයස අවුරුදු 57 ට වඩා අඩු වීම.

**වැටුප් පරිමාව**

තෝරාගත්තා ලද අයදුම්කරු වෙත බැංකු ක්ෂේත්‍රයේ පවත්නා සම්මත, ආකර්ෂණීය දීමනාවන් සහිත වැටුපකට හිමිකම් කියනු ලබයි.

**අයදුම් කළ යුතු ආකාරය**

ජීව දත්ත තොරතුරු ඇතුළත් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු ද සහිතව විෂය (Subject) තීරයේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර, 2023 දෙසැම්බර් 13 දින හෝ ඊට පෙර **careers@rdb.lk** ඊ-මේල් තැපැල් ලිපිනයට යොමු කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරාලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank


ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk